Page 4 April 2013.qxd 15/05/2013 06:46 Page 1

ලංකාවිත්ති
LANKA VITHTHI

පුවත්පතින් ඉටු වූ ජාතික මෙහෙය

♦ වකුල ගුණපාල විසිනි

දැනට වසර දහයකට පමණ පෙර එනම් 1996 වකවානුව අප රටේ කාහටත් දුර් දාන්ත කාල පරිච්ඡේදයක් බවට පත්වී තිබිණ. කොටි සතුරන් සමස්ථ ශ්‍රීලාංකීය ජනතාවට එදිරිව විවෘත අභියෝග කළා පමණක් නොව සංවිධිත කොටි හමුදා උතුරු නැගණිහිර භූමි ප්‍රදේශ බොහොමයක්ම සම්පූර්ණයෙන්ම වාගේ අරක්ගෙන සිටියෝය. 1977 සිට 1994 දක්වා වසර දාහතක් බලයේ සිටි ජේ. ආර්., ප්‍රේමදාස ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු යටතේ ඇතිවී තිබුණු අරාජික තත්වයන්ගේ ප්‍රතිඵල වශයෙන් හොඳට බැට කා සිටි පොදු ජනතාව 1994 ජනාධිපති ඡන්දයේදී අළුත් ජනාධිපතිනියක් පත්කරගත්තේ සතුරු උපද්‍රව වලින් තොර නව යුගයක් උදාකර ගැන්මේ ඉමහත් අපේක්ෂා ඇතුව ය.

ජාතික ප්‍රශ්නය සහ අපේ දේශපාලනය

ඊනියා ජාතික ප්‍රශ්නය මේ වන විට ඔඩු දුවාගිය තුවාලයක තත්වයට මෝරා තිබිණ. බණ්ඩාරනායක යුවලටවත් එයට පසු බලය ගත් ජයවර්ධන, ප්‍රේමදාසලාටවත් මෙයට විසඳුම් කෙසේ වත් ලබාගත නොහැකි බව පැහැදිලි වෙමින් පැවතිණ. ඒ බටහිර දෘෂ්ටි කෝණයෙන් පිටස්තරව ඔවුනට සිය රටේ ප්‍රශ්න දෙස බැලිය නොහැකි වූ නිසාය. දුවිඩ නායකත්වය විශේෂයෙන්ම, උතුරේ ප්‍රභූ පැලැන්තිය වූ වෙල්ලාලයින්ද එවැනිම බටහිර ගැති දැක්මකින් යුක්තව එම ප්‍රශ්න වර්ගවාදී ලෙස විග්‍රහ කළහ. දෙපැත්තෙන්ම අළුත් දෙයක් මතු නොවිණ.

කාලයක් අධිරාජ්‍යවාදය යටතේ හැඩගැසී තිබුණ සමස්ථ සමාජ ආර්ථික-සංස්කෘතික ව්‍යුහය එම යටත් විජිත් බවෙන් මුදාගත හැක්කේ එම තත්වයට හේතු වූ බටහිර ගැති චින්තනය තුළින් නොව සමස්ථ ජනතාව තුළින් මතුවන ජාතික චින්තනයක් ඔස්සේ පමණකි. 1956 දී සහ, වෙද, ගුරු, ගොවි, කම්කරු වශයෙන් ජාතික රැල්ලක් මතු වුවද එවැනි පාලනයක් කළමනාකරණය කොට හසුරුවා ලීමේ මට්ටමකට එය මෝරා නොතිබිණ. සිදුවූයේ ජාතියක් වශයෙන් සැවොම එකතු වී අධිරාජ්‍ය විරෝධී ජාතික සටනක් ගෙනයනු වෙනුවට එම විසඳුම් ප්‍රයත්නයන් ලිස්සා ගොස් ජාතිවාදී සටනක් බවට අවාසනාවන්ත ලෙස පෙරළී යාමය.

අප අසල්වැසි ඉන්දියාවේ අධිරාජ්‍ය විරෝධී අරගලය මහත්මා ගාන්ධිතුමා විසින් ගෙන යන ලද ආකාරය දෙස අද ආපසු හැරී බලන අපටද එය හොඳ පාඩමකි. එම සටනේදී ඉදිරියෙන්ම ගොස් පොදු ජනතාවට නායකත්වය දුන්නේ ගාන්ධිතුමාම මිස අන් කිසිවෙකු නොවේ. එම අරගලයේ හරය වූයේ එතුමාගේ පොදුජන ජීවිතය සමග බැඳී පැවති නැතීමයි. නේරුලා, පටෙල්ලා කළේ එම අති මහත් ව්‍යාපාරයට අවංක ලෙස සහාය දීමයි. මහත්මා ගාන්ධිතුමා එසේ නොකරන්නට බටහිර දැක්මකින් හැඩගැසී සිටි නේරුලා යටතේද අප රටේ සිදුවූ ලෙසට නිදහස් සටන මොටවී යාමට ඉඩ තිබුණි.

1980 දශකයේ අප රටේ සිදුවූ පරිහානිය

1977 බලයට පැමිණි ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව බටහිර ගැති ධනවාදී පාලන ක්‍රමයක් ඇරඹුවා සේම එතෙක් අපට සුහදව සිටි ඉන්දියාවේද හොඳ හිත ද බිඳ ගත්තේය. මේවායේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වන විට කුඩා කල්ලි ගණනාවක් වශයෙන් සිටි උතුරේ දුවිඩ කැරළිකරුවනට ඉන්දියාවේ සහායෙන් හමුදා පුහුණුවක් ලැබීමට පොට පැදිණ. බලයෙන් පිම්බී සිටි ජේආර් ආණ්ඩුව ගෙනගිය අමනොඥ අදූරදර්ශී වැඩකටයුතු නිසා හොර මැර කල්ලි විසින් කොළඹ නගරය ඇතුළත බොහෝ කාලයක් තිස්සේ සිංහළ ප්‍රමුඛ අනෙක් ජනයා සමග සුහදව සිටි දුවිඩ ජනයාට සංවිධානය වී කළ පහරදීම්, මහ ඝාතනයන් ඉතාම පහත් මට්ටමේ බේදවාචකයන් වීය.

1956 න් පසු දුවිඩ ජාතිවාදයක් ගොඩ නගා ගැනීමට අවස්ථාවක් සොයමින් සිටි විශේෂයෙන්ම නාගරික මධ්‍යම සහ ඉහළ මධ්‍යම පන්තික දුවිඩ ආර්ථික අවස්ථා වාදීනට මෙහි ප්‍රතිඵල උපරිම භාග්‍යයක් වීය. ඔවිහු සරණාගතයින් ලෙස බුරුතු පිටින් බටහිර රටවලට සංක්‍රමණය වන්නට පටන්ගත්හ. ඔවුන් තෝරාගත්තේ ද බටහිර ඉහළම ජීවන මට්ටම් ඇති රටවල්ය. එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වූ මානව හිමිකම් කවුන්සලයේ නීති උපරිම මට්ටමින් ප්‍රයේජනයට ගනිමින් දුවිඩයින් මිලියනයකටත් අධික පිරිසක් පසුගිය දශක තුන තුළ එසේ සේන්දු වූහ. දැනුදු යති.

ඉතිරි මෑත ඉතිහාසය ඔබ අප සැවොම දනිති.

කොටි සංවිධානය මතුවෙයි

ඉන්දීය සහායෙන් පුහුණුව ලද දුවිඩ කැරළි කල්ලි අතර නායකත්වය සඳහා ගැටුම් ඇරඹිණ. වැඩි කල් නොගොස් ම ඔවුන් අතරින් ඉතාමත්ම නිර්දය ලෙස මිනීමැරිය හැකිවූ ප්‍රභාකරන් නම්වූ ත්‍රස්තවාදියා නායකත්වය ඩැහැ ගත්තේය. ඊළාම් සහ දුවිඩ රාජ්‍යයක් පිළිබඳ සංකල්පය යටතේ දුවිඩ විමුක්තිය සඳහා රාජ්‍යයක් පිහිටුවීම අරමුණු කොටගත් කොටි ව්‍යාපාරයක් බවට පත්විය. ව්‍යාජ සරණාගතයින් වශයෙන් බටහිර රටවලට පැනගත් ඔවුන්ගේ සාමාජිකයන් ඒ රටවල ඒ වනවිට ස්ථාපිතව සිටි දුවිඩයින්ගේ මුදල් සහ ධන සහාය ද ලබමින්ද මෙම කොටි ව්‍යාපාරය නිර්දය ලෙසට කටයුතු කරන හමුදාවක් බවට වැඩිකල් නොගොසින්ම පත්විය. මරාගෙන මැරෙන මිනිස් බෝම්බය කොටින්ගේ ප්‍රබලම ආයුධය වීය.

1990 ගණන් වල මුල් කාලය වනවිට කොටින්ගේ මිනිස් බෝම්බ යුද්ධෝපක්‍රමයේ අලුත්ම ගොදුර බවට පත්වූයේ ඉන්දීය අගමැති රජීව් ගාන්ධි 1991 මැයි 21 දාත්, 1993 මැයි දිනයේදී මරා දමනු ලැබූ ලංකා ජනාධිපති රණසිංහ ප්‍රේමදාසත්ය. ඒ වන විට ප්‍රභාකරන් ගෙනගිය ත්‍රස්තවාදය නිසා අප රට අභ්‍යන්තරයේ විශේෂයෙන්ම සිංහළ මුස්ලිම් ප්‍රදේශවල ජනාකීර්ණ ස්ථානවලත්, සිද්ධස්ථානවල පවා කොටි ඇටවූ මර උගුල් වලට ගොදුරු වූ අහිංසක ජනතාව දස දහස් ගණනින් මියගිය අතර එයට නොඅඩු සංඛ්‍යාවක් මුළු ජීවිතයටම ආබාධිතයින් බවට පත්වී තිබිණ. අප රටේ සාමාන්‍ය ජනතාව එදිනෙදා ජීවිතය ගැන පවා විශ්වාස තබාගත නොහැකි අන්ත අසරණ තත්වයකට පත්වෙමින් සිටියහ.

1994 පාලන වෙනස්වීම් සහ ජනතා අපේක්ෂා

1994 දී නව පාර්ලිමේන්තුවක් සහ නව ජනාධිපතිනියක් බලයට ඒම සමග ජනතාව ඉමහත් බලාපොරොත්තු තබාගත්හ. එදිනෙදා ජීවිතයේ සමහර අංශවලින් යම් සහනයක් ජනතාවට ලැබුණද කොටි ත්‍රස්තවාදය මෙල්ලකිරීමේ පැත්තෙන් නම් සහනදායී පියවරක් ගැනෙන ලකුණු නොපෙනිණ. බලාපොරොත්තු තබාගත හැකි එකම නව පියවරක් ලෙස පෙනුණේ එතෙක් ජයවර්ධනලා අච්චාරු කරගෙන තිබුණු විදේශ ප්‍රතිපත්තියට නව පණක් දෙමින් විදේශ කටයුතු පිළිබඳව දිගු කලෙක මනා අවබෝධයක් ඇති, එසේම විදේශවල මනා පිළිගැනීමක් ලබා සිටි ලක්ෂමන් කදිරගාමර් මහතා විදේශ ඇමතිවරයා වශයෙන් නව ජනාධිපතිනිය විසින් පත්කරනු ලැබීමයි.

ව්‍යවස්ථාවට අනුව රටේ ආරක්ෂක ඇමති ධුරයට පත්වූ නව ජනාධිපතිනියටද ජාතික ප්‍රශ්නයට අළුත් විසඳුමක් දීමේ හැකියාවක් ඇති බවක් නොපෙනිණ. ඇයට ද තිබුණේ බටහිර ගැති චින්තනයකි. ඇය ද එයට පෙර පාලකයින් ගෙනගිය මග ඔස්සේම යමින් කොටි සමග සාකච්ඡා අරඹමින් වැඩ ඇල්ලුවා ය.

බටහිර ගැති පසුගාමී චින්තනය සහ එහි දුර්විපාක

බටහිර අධිරාජ්‍යවාදී නව ලිබරල් චින්තනය අනුව සැකසුණ අපේ මාධ්‍යකාරයින්ද, විශේෂයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යය ද, ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවලින් යැපෙන එන්.ජී.ඕ.කාර රැළද මේවායින් හසුරුවන ලද අපේ විදේශ සහ ආරක්ෂක අංශවල නිලධාරී පිරිසද විසින් දෙන ලද උපදේශ වලට යටවූ දේශපාලකයනට ද අන් අළුත් මගක් නොපෙනිණ.

ඒ කවා තිබුණු චින්තනය නම් :

1. කොටින්ට එරෙහිව මේ යුද්ධය අපේ හමුදාවන්ට කෙසේවත් දිනය නොහැකි ය. ඒ නිසා අප කළ යුත්තේ සුළු ජාතික දුවිඩයින්ගේ එකම නායකත්වය ලෙසින් පිළිගැනුණු කොටින් සමග සාකච්ඡා කොට බලය බෙදීමක් කරා (එනම් රට බෙදීමක් කරා) එළඹීම ය. මෙය එකම විසඳුම ය.

2. බටහිර ගැති ඉංග්‍රීසි මාධ්‍යකාරයිනුත්, බීබීසී, සී. එන්. එන්. ආදී මාධ්‍යයත්, එන්ජීඕ මුදලින් යැපෙමින්, මති මතාන්තර ගොඩනගන්නන් (opinion makers) ලෙස වැජඹුණු ජාති භ්‍රෂ්ටයන් කොටි හමුදා ශක්තිය, උන්ගේ විනයගරුක බව ආදිය පුම්බා තබමින් ටැමිල් නෙට් වැනි කොටි ප්‍රචාරක වෙබ් අඩවි ප්‍රචාරය කළ ආකාරයට අප ජාතික හමුදා ශක්තිය, විනයගරුක බව පහත හෙළමිනුත් දිගින් දිගට ප්‍රචාරය ගෙනයන ලදී.

3. යුද්ධය මහා ආදායම් මාර්ගයක් කරගත් තක්කඩි ව්‍යාපාරිකයනුත්, විදේශ අමාත්‍යංශය සහ ආරක්ෂක අංශවල සිටි දූෂිත නිළධරීනුත්, ඒවාට සම්බන්ධව සිටි සමහර දේශපාලකයිනුත් මේ තත්වයන් ඉදිරියට ගෙනයාමට මං සළසනු විවෘතවම පෙනිණ.

මේවාට යටවූ පාලකයිනුත් රජයේම දේශපාලන උපදේශකයිනුත් ආදී විවිධ අංශවල බලපෑම් වලට යටවූ චන්ද්‍රිකා රජය විටෙක කොටින් සමග සාකච්ඡා කරමින්ද, විටෙක කොටින්ට එරෙහිව යුද්ධ කරමින්ද, රටේ වීර සෙබළුනුත්, ඔවුන් මෙහෙයවූ වීර සෙන්පති යන්ගේත් ජීවිත බිලි දෙමින්ද, විශාල ජාතික ධනස්කන්ධයක් යුද ආයුධ සඳහා නාස්ති කරමින් ද කල් මැරූහ. වරෙක යාපන අර්ධද්වීපය සහ අලිමංකඩ කොටින් අතේ විය. තව වරක එම ප්‍රදේශවලින් කොටි පළවා හැර අප යුද හමුදාව අල්ලා ගනිති. මේ ලෙස කඹ ඇදිල්ලක් වාගේ ඒ අත මේ අත බලය ගියද රටේ ජනතාවට නම් ඉදිරියට වත් අස්වැසිල්ලක් ගෙනෙන ලකුණු නොතිබිණ.

මේවා මෙසේ වෙද්දී කොළඹ සිටි යුද අවි වෙළෙන්දන්ද, යුද්ධය හා ආරක්ෂාවට සම්බන්ධ කොන්ත්‍රාත් අරගෙන සිටියවුන් ද ඒන්ජීඕ සාම කාක්කන් ද, උපදේශකයින් ද, තම දේශපාලක යින්ට සම්බන්ධව සිටි මෝඩ හැතිකරය ද අල්ලාගෙන බාල් නැටූහ. උතුරු නැගණිහිර ප්‍රදේශවල මහ ජනතාව හැම පැත්තෙන්ම බැට කමින් කොටුවී දහදුක් වින්දාහ. දකුණේ සිංහළ හා මුස්ලිම් ජනතාවගේ තත්වය ද ඊට නො-දෙවෙනි විය.

පිටරටවල සිටි දේශප්‍රේමීන්ගේ දැක්ම

මේවා මෙසේ සිදුවෙද්දී පිටරටවල සිටි දේශප්‍රේමීන් සිටියේ තදබල මානසික අවිවේකී තතවයකිනි. කොටි හිතවාදී දුවිඩ පිරිස් ව්‍යාජ ලෙස සරණාගත මුවාවෙන් මෙහි පැමිණ මේ රටේ ජනතාවගේ අනුකම්පාව ලබමින් ශ්‍රීලංකාවට එරෙහිව අමූලික බොරු ගොතා කියමින් කොටි සංවිධානයට පක්ෂව ගෙනගිය ප්‍රයෝගකාරී කටයුතු එළිදරව් කරමින් විශේෂ යෙන් මේ ලියන මා වැනි බ්‍රිතාන්‍යයේ සිටි බො-හෝ දේශප්‍රේමීන් උන් හා ගැටෙමින් මෙහි සිදුවන දේ ගැන සැබෑ තතු හැකි හැම අයුර කින්ම අප රට කරවූ අයට එළිදරව් කරමින් ඔවුන් දැනුවත් කරන්නට කටයුතු කළෝය. බොහෝ විට එදිනෙදා කටයුතු වලට සහ ප්‍රශ්න වලට යටවී සිටි අප රටේ බොහෝ අයට පෙනුනාට වඩා මේ සිදුවීම්වල යථාර්ථය ඒ පිටරට අයට පෙනුණි.

එසේම යුරෝපය, ඇමරිකාව, කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි රටවල සිටි දේශ හිතෛෂී හිතමිතුරන්ගෙන් ද මේ ආකාරයටම කොටි ව්‍යාපාරය ස්ථාපිත කරගැන්මට මේ කෛරාටික යින් ඒ රටවල ගෙනයන ව්‍යාපාර පිළිබඳ අප ද දැනුම්වත් වීමු.

මේ අසාධාරණයන්ට ඉඩ නොදී දේශ හිතෛෂින් එකමුතු කරන නව මගකට අප අවතීර්ණ විය යුතු බව පැහැදිලිව පෙනිණ.

නව දැක්මක අවශ්‍යතාව

වාසනාවකට මේවාට යට නොවී අළුතෙන් සිතා නව පැත්තකට යායුතුය යන අදහස විශේෂයෙන්ම අළුත් දෙයක් කවදත් මතුවූ පරිදි ම අප රටේ ග්‍රාමීය ජනතාව අතරින් මතුවී ආ පාලන බලයේ සිටි පොදු පෙරමුණේම ඊළඟ පරපුරේ සමහර දේශපාලකයින් තුළින් නව දැක්මක අරුණළු වැටෙනු පෙනිණ.

මේ කාලය වනවිට ජාතික චින්තනයක අවශ්‍යතාව පිළිබඳව ජාති හිතෛෂින් වූ මහා චාර්ය නලීන් ද සිල්වා, ගුණදාස අමරසේකර වැනි වියතුන්ගෙන්ද ප්‍රකාශවීම ඇරඹී තිබුණේය.

ලන්ඩනයේ ලංකාවිත්ති බිහිවෙයි

එකල දැන් මෙන් අන්තර්ජාලය හෝ වෙබ්අඩවි තිබුණේ නැත. කිසිවෙකු ළඟ කොම්පියුටර් ද නොවීය. මොබයිල් දුරකථන ගැන ඇසුවේ වත් නැත. අදහස් හුවමාරුව ඉතා දුෂ්කර කාර්ය යක් විය. බොහෝ අය අතරේ සාකච්ඡා පැවතියේ ගෙදර හෝ බොහෝ විට පාරේ සවි කර ඇති ටෙලිපෝන් පෙට්ටියක් මගිනි. අපට ලන්ඩනයට සිංහළ පුවත්පතක් වැනි මාධ්‍යයක් ඇත්නම් කොපමණ හොඳදැයි යන අදහස 1997 ආරම්භ වන විට මෙහි දේශ හිතෛෂින් ගේ සිත්වල පාවෙමින් තිබිණ.

අප සැමගේම වාසනාවකට මෙන් එවැන් නක් යථාර්ථය බවට පත්කිරීමට දැනුම, හැකි යාව, අත්දැකීම්, කුසලතා මෙන්ම ඒ සියල්ලටම වඩා වැදගත්ම දෙය වූ ජාති හිතෛෂීබව, කැක්කුම හා ආකල්ප ඇති පුද්ගලයෙකු ලන්ඩනයේ සිටියේය. ඔහු නම් පුවත්පත් ක්ෂෙත්‍රයේ ලංකාවේ දීර්ඝ කාලයක් කටයුතුකර

පළපුරුද්ද ඇති, කවියෙකු, ගීත හා තිරකතා රචකයෙකු, කලාකරුවෙකු වශයෙන් කවුරුත් අතරේ ප්‍රසිද්ධියක් ලබා සිටි දයා ආනන්ද රණසිංහ මහතාය. එසේම එවැන්නක යෙදීමට නිදහසද, තාරුණ්‍යය සහ ක්‍රියාශීලී බවද ඔහුට නොඅඩුව තිබිණ. ඒ සියල්ලේ සංකලනයෙනුත් බොහෝ අයගේ අපේක්ෂාවන් ප්‍රකාශකරනු ලැබීම නිසාත් ඒ මහතා මේ භාරදූර කාර්‍යය ජාතියේ වාසනාවකට බාරගත්තේය.

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය !

ලංකාවිත්ති යන නාමයෙන් මාසිකයක් වශයෙන් හැම අතකින්ම, අංශයකින්ම සම්පූර්ණකොට සකසා ලංකාවෙන් පිට ප්‍රකාශ වූ ප්‍රථම සිංහළ පුවත්පත වශයෙන් 1997 අප්‍රියෙල් මස සිංහළ අවුරුද්ද දා එය ලන්ඩනයේ දී නිකුත් විය. ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පිටු අටකින් යුත් එහි ආදර්ශ පාඨය වූ මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය යන වැකියම එම පුවත්පතේ කැප වීම මොනවට ප්‍රකාශ කළේය. මේ අවධියේ ලංකාවිත්ති වැනි දේශ හිතෛෂී පුවත්පතක් පළවී ලොවපුරා රටවලටද බෙදාහැරීම විදේශ ගත අප ජනතාවට ඉමහත් අස්වැසිල්ලක් විය.

එදා ඒ බිහිවූ පුවත්පත සෑම අතකින්ම මව්බිමේ සේවය සඳහා කැපවූවක් විය. ලාංකික බව පිළිබිඹු කරන විවිධත්වයෙන් යුක්ත විය. පුවත්පත් කලාව අනුව සැකසුණු එය පාඨකයා ගේ සිත් ඇද බැඳගත හැකි ලක්ෂණයන්ගෙන් පිරී තිබිණ.

මුල් පිටුවේ පළවූ ඡායාරූපය හා කවිය බොහෝ විට එම කළඹේ තේමාවට ගැලපෙන වැදගත්කමෙන් යුක්ත වූවකි. නැති නම් සිරස්තලය එම කාර්යය ඉටු කළේය. මුල් පිටුවේ ලිපිය කාලෝචිත දේශපාලනමය හෝ සමාජීය අරුතෙන් ගැඹුරෙන් සැකසුනෙක් විය. කතුවැකිය සහ බුදු දහමින් හෙබි ලිපි සඳහා දෙවෙනි පිට වෙන්විය. අන්තර්ජාලයෙන් හා ටෙලිවිෂනයෙන් අප ලංකාව ගැන හෝ ලොව වැදගත් ප්‍රවෘත්ති කියවන අද ඒවා මසකට පසු පුවත්පතකින් ආපසු පාඨකයාට දීම නිශ්ඵල කාර්යයකි. ඒවා අළලා අදහස් මතිමතාන්තර බුද්ධිමත්ව පැවසීම ඊට වඩා වැදගත්ය. කාව්‍ය මය සාහිත්‍යමය සංස්කෘතික කලාත්මක සහ හාස්‍යය ආදී අංග වලින්ද ලංකාවිත්ති පත්‍රය සාරවත් බව කියා පෑය. කොටින්ම ලංකා විත්තිය පිටරට සිටින දේශප්‍රේමීන්ගේ මාසික සංසදය බවට පත්විය. මුලදී සඳහන් කළ ආකා රයෙන් රට ප්‍රපාතයට ඇදීයන අවධියක ඇරඹුණ මේ පුවත්පත පිටරටවල සිටින සිංහළ පාඨකයාට පමණක් නොව ලංකාවේ අයටද කොටි සතුරා වැනසිය යුතුය, වැනසිය හැකිය, යන පණිවුඩය දෙමින් ඒ කාර්යය ඉටුකරන අයට ආත්ම ධෛර්‍යයක්, නව පණක් දීම වැදගත්ම අරමුණ ලෙස සැලකීය.

මුලදී සඳහන් කළ පරිදිම බටහිර ගැති අමන මෝඩ දේශපාලකයින් විසින් 2000-2002 පමණ වනවිට රට ප්‍රපාතයට ගෙන යෑමේ ප්‍රයත්නයන් වළක්වා අප ගම්බිඳින් මතුවූ නව දේශපාලන රැල්ලකින් නව ජනාධිපතිවරයෙක් බලයට ආය. එම නව රැල්ල සමග ලංකා විත්ති පුවත්පත යුදබිමේ, ගොවිබිමේ, වැඩබිමේ ආදී වශයෙන් සිංහලයින් සිටියේ කොතැනද, ලොව කොතැන වුවද, ඒ අය සමග විය. විශේෂයෙන් 2006-2009 සමයේදී යුද පෙරමුණේ සිටි සෙබළ සොහො-යුරු සොහොයුරියන් සමගත් සිටි ලංකා විත්ති ජාතියේ ආසිරි හා පැතුම් ඔවුන්ට දෙමින් ඔවුන් දිරිමත් කළා සේම ඔවුන් ගැන තොරතුරු නොවළහා ආපසු පාඨක ජනතාව වෙතට ද ගෙන ආවා ය.

කොටි සතුරා වනසන තුරුම නොපසු බටව සිටි ලංකාවිත්ති ජයග්‍රහණයෙන් පසුද සතුරු කොටි නැට්ට ගැන ද විමසිල්ලෙන් සිටියි.

එහෙත් ලංකාවිත්ති මේ අවසාන කලාපය බව නොබෝදා ඇසුවිට මා සිතට ඇතිවූයේ ඉමහත් සංවේගයකි. පත්‍රයට ලැදි බොහෝ පාඨකයින්ට ද එසේ දැනෙනු නොඅනුමානය.

උපන්දේශයේ යුගයක අවශ්‍යතාව ඉටුකර නික්මයන දේශ හිතෛෂී පුවත්පත් ලොව බිහි වන්නේ කලාතුරකිනි. ලංකාවිත්තියද එවැන්නකි ඒ නමද ඉන් සිදුවූ අමිල සේවයද චිරාත්කලක් ලොවපුරා සිටින ලාංකික පාඨක ජනතාව ආදරයෙන් සිහිපත් කරන බව නිසැක ය.

Wakula Gunapala - Essex - UK